# දඟකාර වලස් පැංවා



W.A ත්‍යාගා දෙවත්මිණී විජේසූරිය

# දඹකාර වලස් පැංචා

**W.A. ත්‍යාගා දෙවන්මිණී විජේසූරිය**

ISBN - 978-624-206-850-3

**වෙනත් කෘති- එයා දැන් හොඳ ළමයෙක්**

කෘතිය පළ කළ දිනය : **2023.11.15**

# පිදුම

පුංචි සිතුවිලි ගොන්නක් අකුරු කරන්නට
දිරිදුන් මා දයාබර  සමන්මලී ගුරු
මෑණියන්ටත්, මා දයාබර මගේ අම්මාටත්
තාත්තාටත්, සෙවණැල්ල මෙන් මා රකිනා
අපේ අම්මාටත්,
මගේ පුංචි හුරතලී නංගි සනාදිටත්,
ගෞරවාදරයෙන් පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන් ම, ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි . එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට, විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ,දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම, පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි . දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන්, රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි .

**2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට, මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු .තවද, ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ,ගුරුභවතුන් ,දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් ,සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ,ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා
සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය-
මහනුවර

පුංචි වලස් පවුලක් හිටියා. මේ වලස් පවුලේ හිටියේ වලස් අම්මයි වලස් පැටියයි වලස් තාත්තයි.



මේ පවුල පැටියත් සමඟ කැලේ ඇවිදින්න

ගියා. වලස් පැටියා හරිම දඟකාරයි. පැටියා

දුව දුව යනවා.

ගල් උඩ නගිනවා.

ගස් උඩ නගිනවා.

වැටෙනවා.

ඉතින් මේ වලස් අම්මා කියනවා

පුතේ දුවන්නේ නැතුව යමුකෝ

කියලා.



ඔහොම යද්දි පැටියා අම්මට කිවුවා අම්මේ මට බඩගිනියි කියලා.

වලස් තාත්තා පැටියට මෙහෙම

කිව්වා  පුතේ අම්මයි ඔයයි  මේ ගල

උඩට වෙලා ඉන්න.  මම ඉක්මනට ම

ඔය දෙන්නට කන්න මොනවා හරි

අරන් එන්නම්  කියලා.



ඒත් මේ පැටියගේ දැඟලිල්ල නම් ඉවර උනේ නෑ. ටික වේලාවක් යද්දි තාත්තා පැටියටයි අම්මටයි මී වදයක් කඩාගෙන ආවා .වලස් පැටියා සතුටින් උඩ පැන්නා .



තාත්තා මට රස කෑමක් ගෙනාවා කියලා. එයාලා ගල උඩ ම
මී වදය කාලා ආයෙමත් ගමන පටන් ගත්තා.

ඔහොම යද්දි  වලස් පැටියා කිව්වා අම්මේ මට තිබහයි කියලා .
අම්මා කිව්වා තව ටික දුරක් යමු කියලා.

ඔහොම යනකොට පුංචි ගඟක් හම්බුණා.
පුංචි වලස් පැටියා අම්මා කියන්නත් ඉස්සර ගඟට පැන්නා.
එතකොට ම ලොකු කිඹුලෙක් පුංචි වලස් පැටියාව අල්ලගන්න ආවා.
එතකොට ම වලස් තාත්තා  එයාගෙ අතේ තිබුණ ලොකු පොල්ලත්
අරගෙන ම ගඟට පැන්නා .



කිඹුලා තාත්තගේ පැත්තට හැරුණු ගමන්ම වලස් තාත්තගෙ අතේ තිබුණු පොල්ල කිඹුලගෙ කටට වීසි කළා.

ඊට පස්සෙ වලස් අම්මා ඉක්මනට ම වලස් පැටියව බේර ගත්තා.

වලස් තාත්තත් බේරිලා ආවා.

පුතේ අම්මයි තාත්තයි දෙන්නම ඔයාට හොඳ පුතෙක් වෙන්න

කියන්නේ එකයි. ආයෙ මම දඟ කරන්නෙ නෑ.

අම්මගෙ තුරුළට ගිහින් පැටියා කිව්වා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස් වන
පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේමහාමායා පුංචි ගත්කතුවරියන්ය .පාසල

තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු දරුවන්ද රචනා කරනනට විය .ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි . මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි . දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු විමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

**සෙනවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථකරණය යොමු කල**

**ව්‍යාපෘතියේ නිර්මාපක**

**2023.11.01**